**මොණරාගල, බුත්තල ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය - 2015**

---------------------------------------------------------------------------

මොණරාගල, බුත්තල ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා බෙල්ජියමේ කේබීසී බැන්ක් එන් වී (කේබීසී) අතර 2014 ජුනි 16 දින එළඹි ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මොණරාගල හා බුත්තල නගරවල සහ අර්ධ නාගරික ප්‍රදේශවල ගෘහ පාරිභොගිකයින් සහ වාණිජ හා කාර්මික ක්ෂේත්‍රවල පාරිභෝගිකයින් 50,000 කට වැඩිදියුණු කල ජලය සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපාතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 5,545.48 කට සමාන යූරෝ මිලියන 31.41 ක් වේ. ඉන් රු.මිලියන 2,291.76 කට සමාන යූරෝ මිලියන 13 ක ණය මුදලක් වශයෙන් ලබාදීමට කේබීසී බැන්ක් එන් වී එකඟ වී ඇති අතර රු.මිලියන 353.27 කට සමාන යූරෝ මිලියන 02 ක මුදලක් බෙල්ජියම් එක්ස්පෝට් පෝෂන් යටතේ ප්‍රදානයක් ලෙස ලබා දෙනු ඇත. තවද, රු.මිලියන 1,590.45 කට සමාන යූරෝ මිලියන 8.98 ක් ලබාදීමට හැටන් නැෂනල් බැංකුව එකඟ වී ඇත. ව්‍යාපෘතියේ කටයුතු 2014 දෙසැම්බර් 30 දින ආරම්භ වි 2017 ජුනි 30 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය

ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 පරිච්ඡේදයේ විස්තර කර ඇති කරුණු මත මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් මේ දක්වා පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 පරිච්ඡේදයේ පෙන්වා දී ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණුකොට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) **2015** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ **2015** දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර ඇති බව සහ

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන චක්‍රලේඛය අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2017 අගෝස්තු 30 දිනදීය.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘතිය විසින් මිලදී ගෙන තිබූ රු.මිලියන 21.10 ක් පිරිවැය වූ මෝටර් රථ, පිරියත, දේපල හා උපකරණ යටතේ දක්වනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණි.

### 2.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---

1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6(1) වගන්තිය අනුව රු.මිලියන 5 ක් හෝ ඊට වැඩි කොන්ත්‍රාත් භාරගන්නා කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතුයි. තවද, ටෙන්ඩරය පිරිනැමීමෙන් පසුව දින 60 ක් ඇතුළත කොන්ත්‍රාත් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කල යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කාර්යයන්වල යෙදී ඇති කොන්ත්‍රාත්කරු මෙම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

### 2.2.4 සැසඳීම් නොකළ ශේෂයන්

---

ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කෙරීගෙන යන වැඩවල වටිනාකම වූ රු.මිලියන 1,420.94 ක මුදල ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල අදාල කෙරීගෙන යන වැඩ ලෙස පෙන්වා තිබූ රු.මිලියන 1,421.91 සමඟ එකඟ වී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ

| ප්‍රභවය | ණයගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | යූරෝ මිලියන | රු. මිලියන | රු. මිලියන | යූරෝ මිලියන | රු. මිලියන | යූරෝ මිලියන | රු. මිලියන |
| කේබීසී - ප්‍රදාන | 13.00 | 2,291.76 | | 4.04 | **611.89** | **7.03** | **1,094.14** |
| ණය | 2.00 | 353.27 | 1,300.00 | | | | |
| එච්එන්බී | 8.98 | 1,590.45 | - | 1.97 | **298.03** | **3.78** | **589.25** |
| ශ්‍රී ලංර | 7.43 | 1,310.00 | 682.12 | 0.71 | **112.63** | **0.77** | **116.86** |
| එකතුව | **31.41** | **5,545.48** | **1,982.12** | 6.72 | 1,022.55 | 11.58 | **1,800.25** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දේශීය හා විදේශීය නියෝජිත ආයතන මගින් ලබාගත් ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර පාලිත ණය ගිවිසුමක් අත්සන් කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් දේශීය හා විදේශීය නියෝජිත ආයතනයන්ගෙන් ණය හා ප්‍රදාන ලෙස ලැබූ එකතුව රු. මිලියන 1,814 ක් ලෙස දක්වා තිබූ මුදල, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන වාර්තාවල දැක්වෙන රු.මිලියන 1,683ක අනුරූප වටිනාකම සමඟ සංසන්දනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාලානුරූපීව මූල්‍ය හා භෞතික ඉලක්ක ලඟාකර ගැනීම සඳහා විස්තීරණ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබූ නිසා ශ්‍රී ලංකා රජය විසින් ඉඩම් අත්පත් කර ගැනීම, මාර්ග පුනරුත්ථාපනය, ග්‍රාමීය ජල සම්පාදනය සංවර්ධන හා බදු සඳහා වෙන්කර තිබූ රු.මිලියන 1,310 ක මුදලින් 2015 දෙසැම්බර් 31 දින දක්වා භාවිතා කර තිබෙනුයේ සියයට 8.92 කට සමාන රු.මිලියන 116.86 ක් පමණි.

**3.2 භෞතික ප්‍රගතිය**

**------------------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය**

(අ) ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කල ප්‍රගති වාර්තා අනුව බුත්තල භූගත ජලාශය ඉදිකිරීමේ කාර්යයන් 2015 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කර ජාතික ජල සම්පාදන හා ජල පවහන මණ්ඩලයට භාර දී තිබුණි. කෙසේ වුවද 2015 දෙසැම්බර් 31 දිනට බුත්තල හා මඩුල්ල ප්‍රදේශවල සම්ප්‍රේෂණය හා බෙදා හැරීම් කටයුතු සඳහා ජලනල සැපයීම හා එලීම සියයට 11 සිට සියයට 62 ක් දක්වා වූ මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කරනු ලැබීය. ලැබී ඇති තොරතුරු අනුව, අපේක්ෂිත බෙදාහැරීම් ජලනල එලීම මීටර් 350,342 ක ප්‍රමාණයෙන් 2017 ඔක්තෝබර් 30 දින දක්වා මීටර් 137,842 ක් පමණක් ජලනල එලා තිබුණි. 2017 ඔක්තෝබර් 30 දිනට නව ජල සම්බන්ධතා 2,360 ක් ලෙස නිරීක්ෂණය වුවද, පිරිසිදු ජලය නිෂ්පාදනය දිනකට ඝන මීටර් 12,200 ක් දක්වා වැඩි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට මඩුල්ල කාර්යාල ගොඩනැගිල්ල සහ නිලනිවාස ඉදිකිරීම් කාර්යයන් අපේක්ෂිත ප්‍රගතිය වූ සියයට 29 ට වඩා පහල අගයක් වූ සියයට 09 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කරනු ලැබීය. කෙසේ වුවද, ඉදිකිරීම් කටයුතු මන්දගාමී වීම සඳහා හේතු විගණනය සඳහා පැහැදිලි නොවුණි.

**3.3 මූල්‍ය පාලන දුර්වලතා**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 626 අනුව සෑම ව්‍යාපෘතියක් සඳහාම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට වෙනම ගිණුම් වාර්තා ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යා යුතුව ඇත. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවෙමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන මුදල් පොතෙහි ව්‍යාපෘතියේ ලැබීම් හා ගෙවීම් සටහන් කිරීමට භාවිතා කර තිබුණි.

(ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව ව්‍යාපෘතිය ස්ථාවර වත්කම් ලේඛනයක් ක්‍රමවත් ලෙස පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඇ) 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 133 අනුව ව්‍යාපෘතියේ කාර්යයන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි.